**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 21 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ)** 2011 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු හිඟ මුද්දර ගාස්තු රු.400,000 ක් සමුච්චිත අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ආදායම් හා වියදම් ගිණුමේ දැක්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

**(ආ)** එකතුව රු.945,330 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම්, ආදායම් හා වියදම් ගිණුමේ රු.759,570 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.185,760 කින් වර්ෂයේ ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ)** රු.224,719 ක් වූ හිඟ උසාවි දඩ වටිනාකම ශේෂ පත්‍රයේ ආදායම් ණයගැතියෝ යටතේ දක්වා නොතිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

වසර 03 කට අධික කාලයක සිට පැවත එන විෂයයන් 04 කට අදාළ රු.673,031 ක ලැබිය යුතු ගිණුම්ද, විෂයයන් 06 කට අයත් එකතුව රු.846,891 ක් වූ ගෙවිය යුතු ගිණුම්ද නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු32,778,692 ක්වූ ගිණුම් විෂයයන් 06 ක් සම්බන්ධයෙන් අයිතිය සනාථ කිරීමේ ලියවිලි/විස්තරාත්මක උපලේඛණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය රු.336,098 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් ඌනතාවය රු.2,322,226 ක් විය.

**2.2. ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාපනතේ 134(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 හිඟ කඩකුලී**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගතයුතු හිඟ කඩකුලී ශේෂය රු.454,764 ක් වූ අතර, එම ශේෂය තුළ ඇතුළත් රු.254,350 ක් දිගින් දිගටම අය නොවී පවතින හිඟ ශේෂයක් විය.

**2.2.3 හිඟ කසල බදු**

**----------------**

දිගින් දිගටම ගිණුම්වල දැක්වෙන අය නොවී පවතින හිඟ කසල බදු ආදායම් රු.203,260 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 දුරකථන කුළුණු ගාස්තු**

**--------------------------**

සභා බල ප්‍රදේශය තුළ සම්ප්‍රේෂණ කුළුණු 09 ක් ස්ථාපිත කර තිබූ අතර, අදාල සමාගම් වලින් වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

**03. පද්ධති හා පාලනය.**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඈ)** ණයගැති හා ණයහිමි පාලනය.